අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය
මානව ශාස්ත්‍ර ඒකකය

029

# සමස්ත ලංකා/ජාතික සමාජ විද්‍යා තරගාවලිය - 2019


10 ශ්‍රේණිය

කාලය : පැය 02යි.

විභාග අංකය :- ...........................................

**සැලකිය යුතුයි.**

- පිළිතුරු ලිවීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුයි. එම ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බවද සලකන්න.
- සපයන ලද පිළිතුරක් වෙනස් කිරීම සඳහා තනි ඉරකින් කපා නැවත ලියන්න.
- පිළිතුරු සැපයීම සඳහා පැන්සල භාවිත කිරීමෙන් වළකින්න.



- මකන දියර භාවිත කිරීමෙන් වළකින්න.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 1 - 10 | |
| 11 - 15 | |
| 16 - 20 | |
| 21 - 25 | |
| 26 - 30 | |
| 31 - 35 | |
| 36 - 45 | |
| එකතුව | |

| | |
|---|---|
| පළමු පරීක්ෂකගේ අත්සන | |
| දෙවන පරීක්ෂකගේ අත්සන | |

සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

* ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. මහාවංශයේ ඇතුළත් තොරතුරු විවරණය කිරීම සඳහා ලියන ලද කෘතිය කුමක් ද?
   (1) සීහලට්ඨ කථා (2) වංසත්ථප්පකාසිනි
   (3) උත්තර විහාරට්ඨ කථා (4) විනයට්ඨ කථා

02. ලොව විශාලතම මෝටර් රථ නිෂ්පාදන සමාගමක් වන "හයි හුන්ඩායි" සමාගමේ මූලස්ථානය පිහිටි රට වනුයේ,
   (1) ජර්මනියයි. (2) චීනයයි. (3) මැලේසියාවයි. (4) දකුණු කොරියාවයි.

03. ලෝකයේ අභ්‍යන්තර ජලාශවලින් ආරම්භ වන ගංගා දෙකක් ඇතුළත් වන පිළිතුර කුමක් ද?
   (1) නයිල් හා සර්ඩේරියා (2) ශාන්ත ලෝරන්ස් හා අමුඩේරියා
   (3) නයිල් හා ශාන්ත ලෝරන්ස් (4) අමුඩේරියා හා සර්ඩේරියා

04. ශ්‍රී ලංකාවේ රජරට ශිෂ්ටාචාර සමයේ ලියැවුණු සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) කාව්‍යශේඛරය හා බුදුගුණ අලංකාරය (2) පාරමී ශතකය හා බාලාවතාරය
   (3) ජානකීහරණය හා මුවදෙව්දාවත (4) කාව්‍යශේඛරය හා බාලාවතාරය

05. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) නාමික විධායකය හා සත්‍ය විධායකය යන අංග දෙකකින් සමන්විත වීම.
   (2) රාජ්‍ය නායකයා මෙන් ම ආණ්ඩුවේ නායකයා ද ජනාධිපතිවරයා වීම.
   (3) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වීම.
   (4) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවයක් පැවතීම.

(ලකුණු 1 x 5 = 05 යි)

* ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා දී ඇති නිවැරදි පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06. ක්‍රි.ව. 8 වන හා 9 වන සියවස්වලදී විසිවතාවක් චීනයට රාජ්‍ය තාන්ත්‍රික දූත ගමන් සිදු කළ රජතුමා කවුද?
   (1) II කාශ්‍යප රජු (2) III විජයබාහු රජු (3) I අග්බෝ රජු (4) VI අග්ගබෝධි රජු

07. අතීත ඉංජිනේරුවන් විසින් විද්‍යාත්මක ආදේශන භාවිතා කළ බවට සනාථ කළ හැකි නිදසුනක් වන්නේ,
   (1) රුවන්වැලි සෑය ඉදිකිරීමේ දී අකුණු සන්නායකයක් යෙදීම ය.
   (2) මැටි බඳුන් සෑදීමට සකපෝරුව භාවිතා කිරීම ය.
   (3) උඳුන් දැල්වීමට ස්වභාවික සුළං බලය යොදා ගැනීම ය.
   (4) සොහොන් ගර්භයක ඇටසැකිලි පිළිස්සීමේ දී මැටි නළ යෙදීම ය.

08. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ගෘහස්ථ කර්මාන්ත නඟා සිටුවීමෙන් අත්වන ප්‍රධානතම වාසිය කුමක් ද?
   (1) ස්වභාවික සම්පත්වලින් ප්‍රයෝජන ගැනීම
   (2) විදේශ විනිමය උපයාගත හැකි වීම
   (3) රටේ කර්මාන්ත අංශය සංවර්ධනය වීම
   (4) ග්‍රාමීය පවුල්වල ජීවන තත්ත්වය උසස් වීම

09. "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න තේමා කරගත් රටවල් යුගලයක් වන්නේ,
   (1) ඇමරිකා එක්සත් ජනපදය සහ සිංගප්පූරුවයි.
   (2) සිංගප්පූරුව හා ස්විට්සර්ලන්තයයි.
   (3) ඇමරිකා එක්සත් ජනපදය හා ස්විට්සර්ලන්තයයි.
   (4) සිංගප්පූරුව හා ඕස්ට්‍රේලියාවයි.

10. ජාන තාක්ෂණය හා ක්ලෝනීකරණය භාවිතයෙන් අත්වන වඩාත් වැදගත් ම වාසිය කුමක් ද?
   (1) පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම
   (2) නිෂ්පාදන ධාරිතාවය ඉහළ යාම
   (3) පරිසර හිතකාමී ක්‍රමවේදයක් වීම
   (4) නිෂ්පාදන පිරිවැය අඩු කරගත හැකි වීම

(ලකුණු 1 x 05 = 05 යි)

* ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර තිත් ඉර මත ලියන්න.

11. කෝට්ටේ VI වන බුවනෙකබාහු රාජ්‍ය සමයේ ඇති වූ ...................................................... නම් කැරැල්ල මැඩ පවත්වන ලද්දේ අම්බුළුගල කුමාරයා විසිනි.

12. ''ග්‍රිනිච් මධ්‍යන්හ වේලා කලාපය'' සහ ශ්‍රී ලංකාව අයත් ''මදුරාසි වේලා කලාපය'' අතර වෙනස පැය ............ මිනිත්තු ............. කි.

13. පෘථිවි වායුගෝලීය ස්තර අතර අඩු ම උෂ්ණත්ව අගයක් පවතින්නේ ...................................... ගෝලය තුළ ය.

14. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව ...................................................... කි.

15. CCC ලෙස දැක්වෙන රෝම ඉලක්කම ඉන්දු අරාබි ක්‍රමයට දැක්වෙන අගය ...................................... වේ.

(ලකුණු 2 x 5 = 10 යි)

* ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

16. අතීතයේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද හැඳින් වූ නම කුමක් ද?

.......................................................................................................

17. ගං මෝය හා කලපු ආශ්‍රිතව සිදු කෙරෙන ධීවර කර්මාන්තය හඳුන්වන නම කුමක් ද?

.......................................................................................................

18. ශ්‍රී ලංකාවේ වෙළඳ සැලක පරිභෝජනයට නුසුදුසු ආහාර අලෙවි කිරීම පිළිබඳ පැමිණිලි කළ යුතු ආයතනය කුමක් ද? ..................................................................................

19. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කුමක් ද?

.......................................................................................................


20. ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම ජාතික වනෝද්‍යානය නම් කරන්න.

.......................................................................................................

(ලකුණු 2 x 5 = 10 යි)

* ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

21.




(i) යාබද රූපයෙන් දැක්වෙන ස්ථානය නම් කරන්න.

.......................................................................

(ii) මෙය ඉදි කළ රජතුමාගේ නම කුමක් ද?

.......................................................................

22. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ලේඛන දත්ත - 2006 - 2015





(i) මෙම ප්‍රස්තාරයට අනුව ඉහළම දළ මරණ අනුපාතය වාර්තාවන වර්ෂය කුමක් ද?

.......................................................................

(ii) 2013 වර්ෂයේ දළ උපත් අනුපාතිකය ආසන්න වශයෙන් දහසකට කොපමණ ද?

.......................................................................

23. (27)




(i) රූපයෙන් දැක්වෙන්නේ ඇමරිකා එක්සත් ජනපදයේ මුල්ම ජනපද සිතියම ය. A අක්ෂරයෙන් දැක්වෙන ජනපදය නම් කරන්න.

.................................................................................

(ii) වර්තමානයේ ඇමරිකා එක්සත් ජනපදය සමන්විත වන ප්‍රාන්ත සංඛ්‍යාව කොපමණ ද? (28)

.................................................................................

(24)



(i) මෙම රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන්දැ' යි නම් කරන්න. (29

.................................................................................

(ii) ඔහු පාලන බලය මෙහෙය වන ආසියාතික රට කුමක් ද?

.................................................................................

(25)




(i) මෙම පිත්තුරයෙන් දැක්වෙන නිෂ්පාදන අයත් වන කර්මාන්ත වර්ගය කුමක් ද?

.................................................................................

(ii) මෙම නිෂ්පාදන සඳහා යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය කුමක් ද?

.................................................................................

(ලකුණු 2 x 5 = 10 යි)

* **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවල 'අ' හා 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක් වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(26)

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| (i) මුල්ලේරියාව | A - කොන්ස්තන්තීනු ද සා |
| (ii) දන්තුරේ | B - දියෝගු ද මෙලෝ |
| (iii) රන්දෙණිවල | C - පේරෝ ලෝපේස් ද සූසා |
| (iv) ගන්නෝරුව | D - අපෝන්සු පෙරෙයිරා |
| | E - දොන් ජෙරනිමෝද අසවේදු |

(1) A, B, C, D (2) B, A, E, D (3) C, B, E, D (4) D, C, A, B

(27) 'අ' තීරුව

(i) තේ වගාව
(ii) රබර් වගාව
(iii) පොල් වගාව
(iv) වී වගාව

'ආ' තීරුව

A - කබොක් මිශ්‍ර රතු පස
B - ලෝම සහිත ලැටරයිට් පස
C - ජලය රඳා පවතින දියළු පස
D - ලවණ මිශ්‍ර වැලි පස
E - ක්ෂාරීය නොවන දුඹුරු පස

(1) A, C, D, E  (2) B, A, D, C  (3) C, A, D, B  (4) D, E, A, B

(28) 'අ' තීරුව

(i) නරේශ්වර රජ
(ii) පොවනි රජ
(iii) දුහතර රජ
(iv) තොටබොජක නම් පරුමකයා

'ආ' තීරුව

A - කොත්ගල් කන්ද සෙල්ලිපිය
B - දඹුලු විහාර සෙල්ලිපිය
C - ඇඹුල් අඹේ සෙල්ලිපිය
D - යටහලෙන සෙල්ලිපිය
E - කළුදියපොකුණ සෙල්ලිපිය

(1) A, B, C, D  (2) B, C, D, A  (3) E, B, D, A  (4) D, E, C, B

(29) 'අ' තීරුව

(i) යුරෝපා සංගමය (EU)
(ii) නැෆ්තා වෙළඳ ගිවිසුම (NAFTA)
(iii) සප්තා වෙළඳ ගිවිසුම (SAPTA)
(iv) බිම්ස්ටෙක් සංවිධානය (BIMSTEC)

'ආ' තීරුව

A - කලාපීය වෙළඳාම පුළුල් කිරීම
B - තාක්ෂණික හුවමාරුව
C - නිදහස් වෙළඳාම
D - මූල්‍ය ගණුදෙනු ක්‍රමවත් කිරීම
E - වෙනත් රටවල් සමග සහයෝගීතාව වර්ධනය කිරීම

(1) A, B, C, D  (2) E, A, C, D  (3) D, C, A, B  (4) D, B, E, A

(30) 'අ' තීරුව

(i) මිනිරන්
(ii) මයිකා
(iii) කෙඔලින්
(iv) බෝල්මැටි

'ආ' තීරුව

A - දෙදියවල
B - රා ගෙදර
C - ගොඩකවෙල
D - මීටියාගොඩ
E - මිරිස්ස

(1) B, C, D, A  (2) B, D, A, E  (3) C, B, D, E  (4) D, C, A, B

(ලකුණු 2 x 5 = 10 යි)

* ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(31) i. ශ්‍රී ලංකාවේ සංචාරක අධිකාරිය මඟින් නම් කර ඇති රට අභ්‍යන්තරයේ පිහිටා ඇති ප්‍රධාන සංචාරක කලාපයක් නම් කරන්න.

.................................................................................................... (ලකුණු 01 යි)

ii. වර්තමාන ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන ගැටලු දෙකක් ලියන්න.

....................................................................................................

.................................................................................................... (ලකුණු 02 යි)

iii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නඟා සිටුවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කරන්න.

....................................................................................................

....................................................................................................

....................................................................................................

(32) i. ප්‍රාග් ඓතිහාසික මානවයා වාසය කළ පහතරට වියළි කලාපීය ගල්ලෙනක් නම් කරන්න.

........................................................................................................ (ලකුණු 01 යි)

ii. පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

........................................................................................................

........................................................................................................ (ලකුණු 02 යි)

iii. ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................ (ලකුණු 03 යි)

(33) i. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට වැඩි ම දායකත්වයක් දක්වන්නේ ආර්ථිකයේ කුමන අංශය ද?

........................................................................................................ (ලකුණු 01 යි)

ii. ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න.

........................................................................................................

........................................................................................................ (ලකුණු 02 යි)

iii. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික කටයුතු කෙරෙහි "ගෝලීයකරණය" යහපත් ලෙස බලපා ඇති ආකාරය පිළිබඳ කරුණු තුනක් දක්වන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................ (ලකුණු 03 යි)

(34) i. 2019 ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපෘතියේ තේමාව වූයේ කුමක් ද?

........................................................................................................ (ලකුණු 01 යි)

ii. මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදිකරුවන් අත්අඩංගුවට ගැනීමට හා නඩු පැවරීමට හැකි ආයතන දෙක නම් කරන්න.

........................................................................................................

........................................................................................................ (ලකුණු 02 යි)

iii. ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය උවදුර මර්දනය කිරීම සඳහා ඔබට කළ හැකි ඵලදායි යෝජනා තුනක් සඳහන් කරන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................ (ලකුණු 03 යි)

(35) i. ලෝකයේ දැනට සොයාගෙන ඇති පැරණිතම සිතියම නිර්මාණය කරන ලද්දේ කුමන ජාතිකයෙකු විසින් ද?

........................................................................................................ (ලකුණු 01 යි)

ii. 1:50,000 හූ ලක්ෂණ සිතියම් පත්‍රයක අන්තර්ගත තොරතුරු බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

........................................................................................................

........................................................................................................ (ලකුණු 02 යි)

iii. සාම්ප්‍රදායික ක්‍රම හා සැසඳීමේ දී නූතන සිතියම් විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් සිතියම් නිර්මාණය කිරීමේ දී ඇතිවන වාසි තුනක් ලියන්න.

........................................................................................................

........................................................................................................

........................................................................................................ (ලකුණු 03 යි)

* ප්‍රශ්න අංක 36 - 45 දක්වා දී ඇති ස්ථාන සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ ලකුණු කොට නම් කරන්න.

(36) කතරගරායන් ආරු

(37) කසා තොට

(38) කාවර ගාම

(39) ලංකාපටුන

(40) නාච්චදූව වැව

(41) සමන්ත කූඨ

(42) දීඝවාපි

(43) ගල්සොහොන් කනත්ත

(44) කයිට්ස්

(45) මුල්ලේරියාව

(ලකුණු 2 x 10 = 20 යි)

විභාග අංකය :- ..................................................... ලකුණු :- 10




LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න